# 2015 වර්ෂය සඳහා සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම
# රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

01 2007 ජූලි මස 30 අංක 1508/08 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයට යටත්ව, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධිත පහත සඳහන් ආයතනයන් වෙනුවෙන් 2015 වර්ෂයට ලියාපදිංචි වීම සඳහා ඉදිකිරීම්, අළුත්වැඩියාවන් හා භාණ්ඩ සහ සේවා සැපයීම සඳහා විදේශීය නිෂ්පාදකයින්, අනුමත නියෝජිතවරුන්, දේශීය නිෂ්පාදකයින්, දේශීය සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශක ආයතනයන් ගෙන් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

* රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය www.defence.lk

- ජාතික ශිෂ්‍ය භට බලකාය
- පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
- රාජ්‍ය බුද්ධි සේවය
- ආරක්ෂක සේවා විද්‍යාලය
- ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය
- රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

* ශ්‍රී ලංකා යුද්ධ හමුදාව www.army.lk
* ශ්‍රී ලංකා නාවික හමුදාව www.navy.lk
* ශ්‍රී ලංකා ගුවන් හමුදාව www.airforce.lk
* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව www.rpd.gov.lk
* ආගමන හා විගමන දෙපාර්තමේන්තුව www.immigration.gov.lk
* සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව www.csd.lk
* වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව www.coastguard.gov.lk
* වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව www.sltda.gov.lk/coast_conservation
* නාගරික සංවර්ධන අධිකාරිය www.uda.lk
* සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය www.kdu.ac.lk
* ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව www.landreclamation.lk
* අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය www.nddcb.gov.lk
* ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය www.dscsc.lk
* රණවිරු සේවා අධිකාරිය

## 02. <u>අයදුම්පත්‍ර ලබාගැනීම</u>

අ. දේශීය හා විදේශීය අයදුම්කරුවන්හට 2014.08.18 දින සිට 2014.10.03 දින දක්වා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් හා ඊට අදාල ඉහත සඳහන් දෙපාර්තමේන්තුවල වෙබ් අඩවි වලින් අයදුම්පත බාගත (Download) හැක.

ආ. ලියාපදිංචි වීමට අදාල ඉල්ලුම්පත් කට්ටලය පිටු 57 කින් පමණ යුක්ත වන අතර එය පහත සඳහන් කොටස්වලින් සමන්විත වේ.

1. පිටු 48 කින් පමණ යුක්ත විස්තරාත්මක කාණ්ඩ ලැයිස්තුව
2. ප්‍රධාන ඉල්ලුම්පත් පෝරමය
3. විදේශීය සැපයුම් ආයතනයේ දත්ත පෝරමය (ඇමුණුම "ඒ ")
4. උපදෙස් හා කොන්දේසි අඩංගු පත්‍රිකාව (ඇමුණුම "බී " , "බී1")
5. ඉල්ලුම්පත් භාරගන්නා හා කාණ්ඩ ගාස්තු ගෙවීම සිදුකල හැකි දින පිළිබඳ විස්තරය

03. <u>කාණ්ඩ ගාස්තු ගෙවීම</u>

අ. දේශීය සැපයුම්කරුවෙකුගෙන් එක් කාණ්ඩයක් වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව රු. 1500/=කි

ආ. විදේශීය සැපයුම්කරුවෙකුගෙන් එක් කාණ්ඩයක් වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව ඇමරිකානු ඩොලර් 15 කි.

ඇ. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ **<u>කාර්යාලයට කාණ්ඩ ගාස්තු බාර නොගන්නා බැවින්</u>** 2015 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා කාණ්ඩ ගාස්තු ගෙවීම රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ අංක 7040119 දරණ ගිණුමට බැරවන පරිදි ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගෙවීම් කළ හැකිය.

ඈ. විදේශීය සැපයුම්කරුවන්ද 2015 වර්ෂයට ලියාපදිංචි කිරීම සම්බන්ධව **<u>තානාපති කාර්යාල හරහා කාණ්ඩ ගාස්තු ගෙවීම නතර කර ඇත.</u>** ඒ වෙනුවට විදේශීය අයදුම්කරුවන් Swift Code භාවිතයෙන් ලංකා බැංකුව වෙත මුදල් ගෙවිය යුතුය.

| | | |
|---|---|---|
| Swift No | - | BCEYLKLX |
| Branch Code | - | 747 |
| Account No | - | 7040119 |

ඉ. කාණ්ඩ ගාස්තු ගෙවීමේදී ඉදිරිපත් කරන මුදල් තැන්පතු පත්‍රිකාවෙහි පිටපත අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. (මුදල් ගෙවූ බවට සහතික කෙරෙන පරිදි)

ඊ. දේශීය සැපයුම්කරුවන් හා විදේශීය සැපයුම්කරුවන් කාණ්ඩ ගාස්තු 2014.08.18 දින සිට 2014.10.03 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුලදී ගෙවා අවසන් කළ යුතුය. 2014.10.03 දිනට පසුව ගෙවනු ලබන කාණ්ඩ ගාස්තු පිළිබඳව රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වගකියනු නොලැබේ.

04. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාල ලිපි ලේඛන සමග 2014 ඔක්තෝබර් මස 17 දිනට හෝ ඊට ප්‍රථමයෙන් ලැබෙනසේ, කොළඹ 03 බාලදක්ෂ මාවතේ අංක 15/5 හි රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2015 වර්ෂය දේශීය / විදේශීය " වශයෙන් සඳහන් කළ යුතුය.

05. 2015 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන ආමාත්‍යාංශය

2014 ක්වූ අගෝස්තු මස 11 වන දින
කොළඹ 03 , බාලදක්ෂ මාවතේ අංක 15/5 හි
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ දීය.

ච/